සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

නම : ............................................... පුරවැසි අධ්‍යාපනය කාලය : පැය 02 යි.

වැදගත් :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න.**

(යුතුකම්/ පවුල/ සංස්කෘතියට/ අනන්‍යතාවක්/ සමානාත්මතාවය)

(1) සමාජ ක්‍රමයක් තුළ පුද්ගලයන් ජීවත්වන ආකාරය ........................................................................................ අයත් වේ.

(2) විවිධ ජන කණ්ඩායම් අතර අන්තර් සම්බන්ධතා ගොඩනැගීම තුළින් සමාජය තුළ සහජීවනය, සහෝදරත්වය, ...................................................... හා සාමය සමගිය වර්ධනය වේ.

(3) එක් පරම්පරාවකින් තවත් පරම්පරාවක් වෙත සංස්කෘතිය පවරා දීමේ මූලිකම ඒකකය වන්නේ ................................. .................... ය.

(4) විවිධ වාර්ගික, ආගමික හා භාෂාමය කණ්ඩායම් රාශියක් එකට ජීවත්වන සමාජ කණ්ඩායම්වල එක් එක් කණ්ඩායමට සුවිශේෂී වූ ...................................................... පවතින අතර එය ආරක්ෂා කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

(5) පොදු සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් තම තමන්ට පැවරෙන කාර්යයන් ඉටු කිරීමට ඇති බැඳීම ...................................................... වේ.

- **ප්‍රශ්න අංක 06 සිට 11 දක්වා දී ඇති ප්‍රශ්නවල සපයා ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) මාධ්‍ය භාවිතයේ දී ඵලදායී වැඩසටහන් තෝරාගෙන ඒවා නැරඹීමටත්, අධ්‍යයනය කිරීමටත් පුද්ගලයින් යොමුවිය යුතුය. ( )

(7) අභියෝගයක් සාර්ථකව ජයගැනීමට පූර්ව සූදානමක් හා නිශ්චිත වැඩපිළිවෙළක් අනුගමනය කිරීම අවශ්‍ය වේ. ( )

(8) සතුටට පත්වූ පුද්ගලයකු තුළින් මුහුණ මලානික වීම, ඇස් විශාල වීම, වෙව්ලීම වැනි චර්යාවන් ප්‍රකාශ වේ. ( )

(9) අන්තර්ජාලය හා සමාජ වෙබ් අඩවි පරිහරණයේ දී තොරතුරුවල වහලෙකු ලෙස කටයුතු කිරීම වැදගත් වේ. ( )

(10) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික ලක්ෂණ විදහාපාන රටකි. ( )

● **අංක 11 15 දක්වා ප්‍රශ්නවල නිවැරැදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) අධ්‍යාපනය ලැබීම දරුවෙකුට පවුලෙන් ලැබෙන අයිතිවාසිකමකි. ඒ හා බැඳුණු යුතුකමක් වන්නේ මින් කුමක් ද?

1. ගුරුවරුන්ට අකීකරු වීම.
2. සමාජයට අසහනකාරී පුද්ගලයෙක් වීම.
3. උනන්දුවෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වීම.
4. විභාගවලින් ඌණ සාමාර්ථ ලබා ගැනීම.

(12) මවගේ සහ පියාගේ පාර්ශව වල අය හැඳින්වීම සඳහා නියමිත ඥාති පද භාවිත කිරීමට දරුවෙකු කුඩා අවධියේ සිට ම හුරුපුරුදු විය යුතු ය. ඔබේ පියාගේ අයියාගේ දියණිය'' හැඳින්වීම සඳහා භාවිත කෙරෙන නිවැරැදි ඥාති පදය වන්නේ මින් කුමක් ද?

1. පුංචි අම්මා හෝ ලොකු අම්මා  2. අක්කා හෝ නංගී
3. නැනා හෝ නංගී  4. නැන්දම්මා හෝ පුංචි අම්මා

(13) පුද්ගලයා විසින් ඉටු කළ යුතු නීතිමය යුතුකම් ඇතුළත් නිවැරැදි වරණය වන්නේ මින් කුමක් ද?

1. දෙමාපියන්ට සැලකීම, සම්ප්‍රදායන් රැක ගැනීම.
2. අන්‍ය ආගම්වලට ගරු කිරීම අන්‍ය ජාතීන්ට ගරු කිරීම.
3. ආචාරශීලී වීම, ජාතික වීරවරුන්ට ගරු කිරීම.
4. බදු ගෙවීම, රජයට අවනත වීම.

(14) සමාජ හා මානව විද්‍යාඥයින් සංස්කෘතිය පිළිබඳ විවිධ නිර්වචනන ඉදිරිපත් කර ඇත. එසේ නිර්වචන ඉදිරිපත් කළ විද්‍යාඥයෙක් පහත පිළිතුරු අතරින් තෝරන්න.

1. ඊ. බී. ටයිලර්  2. ඒබ්‍රහම් ලින්කන්
3. කේ. සී. වියර්  4. ජේ. ආර්. ලවෙල්

(15)

| | | |
|---|---|---|
| බෞද්ධාගම | A. | පාස්කු උත්සවය |
| කතෝලික ආගම | B. | රාමසාන් උත්සවය |
| හින්දු ආගම | C. | පොසොන් උත්සවය |
| ඉස්ලාම් ආගම | D. | තෛපොංගල් උත්සවය |

ඉහත දැක්වෙන ආගම් හා බැඳුණු උත්සව පිළිවෙළින් ගැළපූ විට නිවැරැදි පිළිතුර වන්නේ,

1. D, B, C, A  2. C, D, B, A  3. A, B, D, C  4. C, A, D, B

● **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු ලියන්න.**



A.

(16) A පින්තූරයෙන් දැක්වෙන ජාතික සංකේතය හිමිකාරත්වය සහ භාවිත කිරීමේ අයිතිය හිමිවන්නේ ........................................................... ටය.

(17) A පින්තූරයේ දැක්වෙන පළාපෙතිවලින් ........................................................ බව ද, වී කරල්වලින් ....................................................... ද නිරූපණය වේ.



B.

(18) B රූපයේ දැක්වෙන අවස්ථාව හඳුනාගෙන එවැනි අවස්ථාවක දී ඔබ සිටිය යුතු ආකාරය කෙබඳුදැයි ලියන්න. ........................................................



C.

(19) C පින්තූරයෙන් දැක්වෙන්නේ සාමූහිකව කටයුතු කරන අවස්ථාවකි. එවැනි අවස්ථාවකට ඔබ සම්බන්ධ වූ විට ඔබට ලැබෙන ප්‍රයෝජන 02ක් ලියන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................



D.

(20) D පින්තූරයෙන් මව්පිය දූ දරුවන් අතර අන්තර් සබඳතා පැවැත්වෙන අයුරු නිරූපණය වේ. පවුල් පරිසරය තුළ මව්පියන් වෙනුවෙන් ඔබ ඉටුකළ යුතු යුතුකම් දෙකක් ලියන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(ලකුණු 2 × 20 = 40)

# II කොටස

වැදගත් ඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද, අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.

02. (i) ශ්‍රී ලාංකික ජන සමාජයේ දක්නට ලැබෙන බහු සංස්කෘතික ලක්ෂණ දෙකක් පහත දක්වේ. ඒ සඳහා නිදසුන් දෙක බැගින් ලියන්න.

විවිධ ජන වර්ග
1. ..................................................................................
2. ..................................................................................

විවිධ භාෂා
1. ..................................................................................
2. ..................................................................................

(ii) පහත දක්වෙන්නේ ශ්‍රී ලාංකික සංස්කෘතියේ අනන්‍යතාව පිළිඹිබු කරන පින්තූර කිහිපයකි. ඒවා හඳුනාගෙන නිවැරදිව නම් කරන්න.

A



...............................

B



...............................

C



...............................

D



...............................

(ලකුණු 04)

(iii) සමාජය තුළ රාජ්‍ය ලාංඡන සංකේතය භාවිතා කරන අවස්ථා 02ක් ලියා දක්වන්න.

1. ........................................................... 2. ........................................................... (ලකුණු 02)

(iv) බහු සංස්කෘතික ජන සමාජයක් තුළ ජීවත්වන ජනයා එකතුව කටයුතු කරන අවස්ථා 02ක් පහත දක්වේ





එවැනි අවස්ථාවන්ට සහභාගී වීම තුළින් ඔබට වර්ධනය කරගත හැකි ගුණාංග 02ක් ලියා දක්වන්න.

1. ........................................................... 2. ........................................................... (ලකුණු 02)

(v) අයහපත් චිත්තවේගී තත්ත්වයන් පාලනය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 04ක් නම් කරන්න.

*අයහපත් චිත්තවේගී තත්ත්වයන් පාලනය කිරීම.*

1. ..............................................................
2. ..............................................................
3. ..............................................................
4. ..............................................................

(ලකුණු 04)

02. (i) පුද්ගලයාට තම ජීවිතය යහපත්ව හා ගෞරවාන්විතව ගත කිරීමට ඉඩ ප්‍රස්තාව සැකසී ඇත්තේ අයිතිවාසිකම් මගිනි. අයිතිවාසිකම්වල දක්නට ලැබෙන පොදු ලක්‍ෂණ ඇසුරින් පහත සටහනේ හිස්තැන් සම්පූර්ණ කරන්න.




(ii) පුද්ගලයා භුක්ති විඳින අයිතිවාසිකම් කිහිපයක් පහත දැක්වේ. ඒවා සිවිල් හා දේශපාලන වශයෙන් වර්ග කොට පහත රුක් සටහන සම්පූර්ණ කරන්න.

(ලකුණු 03)

A. කැමති ආගමක් ඇදහීම.
B. ඡන්දය ප්‍රකාශ කිරීම.
C. කැමති දේශපාලන පක්‍ෂයකට බැඳීම.
D. කැමති රැකියාවක් කිරීම.
E. ජීවත්වීමේ අයිතිය
F. ඡන්ද අපේක්‍ෂකයෙක් ලෙස ඉදිරිපත් වීම.
G. ආණ්ඩුව විවේචනය කිරීම.
H. කැමති ප්‍රදේශයක ජීවත් වීම.




(ලකුණු 08)

03. (i) ජන සමාජයේ යහපත් පුරවැසියකු ලෙස ජීවත් වීම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග ඇසුරින් හිස්තැන් පුරවන්න.

**ගුණාංග**

- ..............................
- යුතුකම් ඉටු කිරීම.
- ..............................
- සදාචාරාත්මක බව
- ..............................
- ..............................
- චාම් දිවි පැවැත්ම
- අන්‍ය මත ඉවසීම

(ලකුණු 04)

(ii) ජන සමාජයක් තුළ විවිධ ආයතන පවතින අතර එම ආයතන හා අන්තර් සම්බන්ධතා පවත්වයි. පහත ආයතන හා සම්බන්ධ වීම මඟින් ඔබට ලැබෙන ප්‍රයෝජන ආශ්‍රයෙන් පහත සටහන සම්පූර්ණ කරන්න.

ආගමික සංවිධාන
- විනය ගොඩ නැගීම
- ..............................................................................................

මරණාධාර සමිතිය
- පුද්ගල අභාවයක දී මූල්‍ය සහාය ලැබීම.
- ..............................................................................................

ක්‍රීඩා සමිතිය
- ..............................................................................................
- ජය පරාජය විඳගැනීමට හුරුවීම.

(ලකුණු 03)

(iii) ඔබගේ පාසල් ජීවිතය තුළ දී ඔබට මුහුණ දීමට සිදුවිය හැකි අවස්ථා දෙකක් පහත දැක්වේ. එම අවස්ථා සඳහා ඔබ සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේ ද යන්න සඳහන් කරන්න.

(1) විභාගවලට මුහුණ දීම.

1. ..................................................................... 2. .....................................................................

(2) යහළුවන් තරහ වීම.

1. ..................................................................... 2. ..................................................................... (ලකුණු 04)

04.



(i) ඉහත රූපයෙන් දක්වා ඇත්තේ ළමයින් ශ්‍රමිකයින් ලෙස සේවයේ යොදවා ඇති අවස්ථාවකි. ඉන් ඇති විය හැකි බලපෑම් 03ක් ලියන්න.

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................

(ලකුණු 03)

(ii) ළමා ශ්‍රමිකයන් හා සම්බන්ධ සමාජ වගකීම් 02ක් ලියන්න.

1. ............................................................ 2. ............................................................ (ලකුණු 04)

(iii) ළමයින් ආරක්ෂා කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග 04ක් ලියන්න.

1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. .................................................................................................................................. (ලකුණු 04)

05.

A 

B 

C 

D 


(i) දරුවෙකුට පවුලෙන් ලැබෙන සංස්කෘතික දායාද 04ක් ඉහත A, B, C, හා D පින්තූරවලින් දක්වේ. ඒවා නිවැරැදිව හඳුනාගෙන නම් කරන්න.

A. ............................................................ B. ............................................................

C. ............................................................ D. ............................................................ (ලකුණු 04)

(ii) සංස්කෘතික දායාද ආරක්ෂා කිරීමේ පුරවැසි යුතුකම් 03ක් ලියන්න.

1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. .................................................................................................................................. (ලකුණු 03)

(iii) සංස්කෘතික දායාද ආරක්ෂා කිරීමේ ප්‍රයෝජන 04ක් ලියන්න.

1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. .................................................................................................................................. (ලකුණු 04)

06. (i) ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ කහපාට සහ කොළපාට තීරු දෙකෙන් නිරූපණය කෙරෙන ජන වර්ග දෙක නම් කරන්න.

කහපාට ..................................................................................................

කොළපාට .................................................................................................. (ලකුණු 02)

(ii)
A. පැහැදිලිව පෙනෙන ස්ථානයක ඔසවා තැබීම.
B. හානි වූ අවලක්ෂණ වූ කොඩි ප්‍රදර්ශනය කිරීම.
C. සිංහයා උඩු යටිකුරු කර ප්‍රදර්ශනය කිරීම.
D. රජය ප්‍රකාශයට පත්කර ඇති ශෝක දිනයන්හි පමණක් කොඩිය අඩ කුඹු කිරීම.
E. අඳින ඇඳුමක්, ඇතිරිල්ලක් ලෙස යොදා ගැනීම.
F. එසවීම හා පහත් කිරීම සෙමෙන් හා ගෞරවාන්විතව සිදු කිරීම.
G. පොළව ස්පර්ශ වීමට සැලැස්වීම.

ඉහත A සිට G දක්වා ප්‍රකාශ ඇසුරින් ජාතික කොඩිය භාවිතයේ දී නොකළ යුතු ප්‍රකාශ 04ක් තෝරා ලියන්න.

1. ..................................................................................................................................
2. ..................................................................................................................................
3. ..................................................................................................................................
4. .................................................................................................................................. (ලකුණු 04)

(iii) පාසලක ජාතික ගීය ගායනා කරන අවස්ථා 02ක් ලියන්න.

1. ..........................................................................................................................................

2. .......................................................................................................................................... (ලකුණු 02)

(iv)



ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය වන නාගස ඉහත පින්තූරයෙන් දැක්වේ. එය ජාතික වෘක්ෂය ලෙස තෝරා ගැනීමට බලපෑ හේතු 03ක් ලියන්න.

1. ..................................................................................................

2. ..................................................................................................

3. ..................................................................................................

(ලකුණු 03)

07. හරහට සහ පහළට දැක්වෙන උපකාරක පද උපයෝගී කරගෙන පහත දැක්වෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

*හරහට*

2. ඕනෑම පුද්ගලයෙක් තමාට එල්ල වන අභියෝග ජය ගැනීමේ දී තම කටයුතු පිළිබඳ විශ්වාසවන්ත බව හා ........................................ දෘෂ්ටියෙන් තොර විය යුතුයි.
4. අම්මාගේ නංගී සහ තාත්තාගේ මල්ලීගේ බිරිඳ හැඳින්වීම සඳහා මෙම ඥාති පදය භාවිත කෙරේ.
6. සාරධර්ම ඉස්මතු කර පෙන්වන කාව්‍ය ග්‍රන්ථයකි.
9. සෞන්දර්ය ක්‍රියාකාරකම් තුළින් මෙය ලැබේ.
10. කිතුණු බැතිමතුන් මෙම උත්සවය සැමරීමට ගවලෙනක් සාදනු ලැබේ.
11. යුතුකම් ඉටු කිරීමට ඇති බැඳීම ............................................... වේ.

*පහළට*

1. මෙවැනි දේවල් ප්‍රතික්ෂේප කිරීම පවුල් සාමාජිකයකු ලෙස වර්ධනය කරගත යුතු ගුණාංගයකි.
3. පාසල තුළ දක්නට ලැබෙන සාමජ යහපතට හේතුවන ආයතනයකි.
5. මුහුණේ නපුරු බව, ඇස් විශාල වීම, වෙව්ලීම වැනි ලක්ෂණ දැකිය හැකි චිත්තවේගී තත්ත්වයකි.
7. මිනිසා තුළ තිබිය යුතු උතුම් ගුණාංගයකි.
8. නියමිත වයස සම්පූර්ණ කළ රජයේ සේවකයින් සඳහා මෙම වැටුප ලැබේ.

(ලකුණු 11)



**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

# තෙවන වාර පරීක්ෂණය - 7 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 7 - 2019

## පුරවැසි අධ්‍යාපනය පිළිතුරු පත්‍රය

## I කොටස

| | | |
|---|---|---|
| 01. සංස්කෘතියට | 06. (✓) | 11. (3) |
| 02. සමානාත්මතාවය | 07. (✓) | 12. (2) |
| 03. පවුල | 08. (✗) | 13. (4) |
| 04. අනන්‍යතාවක් | 09. (✗) | 14. (1) |
| 05. යුතුකම් | 10. (✓) | 15. (4) |

16. ජනාධිපති තුමා
17. ● පළාපෙති - පාරිශුද්ධ බව ● වී කරල් - සෞභාග්‍ය
18. සීරුවෙන්
19. ● මිත්‍රශීලී බව වර්ධනය වීම.
    ● සහයෝගයෙන් කටයුතු කළ හැකි වීම. (අදාළ පිළිතුරුවලට ලකුණු ලබාදෙන්න.)
20. ● දෙමව්පියන්ගේ මිල මුදල් ආරක්ෂා කිරීම.
    ● බාල සහෝදර සහෝදරියන් රැක බලා ගැනීම.
    ● පවුලේ වැඩ කටයුතුවලට උදව් කිරීම. (අදාළ පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.)

## II කොටස

(01) (i) ජනවර්ග සිංහල/ දෙමළ/ මුස්ලිම්/ බර්ගර්/ මැලේ
භාෂා සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි

(ii) A. සමාධි පිළිමය
B. කෝනේශ්වරම් කෝවිල
C. දවටගහ මුස්ලිම් පල්ලිය
D. මඩු පල්ලිය

(iii) මුදල් නෝට්ටු/ විදේශ ගමන් බලපත්‍රය/ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු ලිපි ශීර්ෂ
(අදාළ නිවැරැදි පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(iv) ● සහයෝගය ● සමගිය
● එකමුතුබව ● අන් මත ඉවසීම
(අදාළ නිවැරැදි පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(v) ● ආගමික කටයුතුවල යෙදීම.
● ඇවිදීම ● කවි ගීත ගායනය
● චිත්‍ර ඇඳීම.

(29 පිටුව)

02. (i) (1) සමාජය තුළින්ම හිමි වේ.
(2) අසීමිත නොවී පවතියි.
(3) ආත්මාර්ථකාමීත්වයෙන් තොර වෙයි.

(ii) සිවිල් අයිතිවාසිකම් - A, D, E, H
දේශපාලන අයිතිවාසිකම් - B, C, F, G

(03) (i) ● අයිතිවාසිකම්වලට ගරු කිරීම.
● නීතිගරුක බව ● ප්‍රියවචන භාවිතය
● පරාර්ථකාමී බව ● විනයගරුක බව
● දයාව, කරුණාව
● අන් අයට ආදරය කිරීම.
(මින් කරුණු 04ක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.)

(ii) *ආගමික සංවිධාන*
● අවමංගල කටයුතුවලට සහාය දැක්වීම.
● දහම් දැනුම ලබාදීම.

*මරණාධාර සමිති*
● අවමංගල අවස්ථාවක දී එම නිවසේ සියලු කටයුතු ඉටුකර දීම.
● සහන පොළී මත ණය ලබාදීම.

*ක්‍රීඩා සමිති*
● ක්‍රීඩා හැකියා දියුණු කරගත හැකි වීම.
● නායකත්ව ගුණාංග වර්ධනය කරගැනීමට හැකිවීම.
● නායකත්වයට ගරු කිරීම.
(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(iii) (1) ● හොඳින් පාඩම් කිරීම.
● දිනපතා පාසල් පැමිණීම.
● විෂයන්ට අදාළ අමතර පොත් කියවීම.

(2) ● ඉවසීම
● හරි වැරැදි පෙන්වා දීම.
● නිශ්ශබ්ද වීම.

(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.)

04. (i) ● කායික හා මානසික ශක්තිය පිරිහීමෙන් රෝගී වීම.
● ශ්‍රමය සූරා කෑමට ලක්වීම.
● සුන්දර ළමා කාලය අහිමි වීම.
● අපයෝජනයට ලක්වීම.
● ඉගෙනීමට ඇති අවස්ථා අහිමි වීම.
● වදහිංසාවලට ලක්වීම.

(පිටුව 65)

(ii) ● සියලු දරුවන් අපේ දරුවන් ලෙස සැලකීම.
● අනිවාර්යය අධ්‍යාපනය සඳහා පාසලකට යොමු කිරීම.

(පිටුව 65)

(iii) ● නීති රීති පැනවීම.
● දරුවන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම.
● නොමිලේ හෝ සහනදායී ලෙස අධ්‍යාපන පහසුකම් ලබාදීම.
● ශිෂ්‍යත්ව ලබාදීම.
● රැකියා ලැබෙන තුරු දීමනා ලබාදීම.

05. (i) A. වැඩිහිටියන්ට සැලකීම.
B. නිවැරැදි ආහාර පුරුදු ඇති කරගැනීම.
C. මංගල චාරිත්‍ර ඉටු කිරීම.
D. අවමංගල චාරිත්‍ර ඉටු කිරීම.

(ii) ● සංස්කෘතික දායාද ආරක්ෂා කරගැනීමේ වටිනාකම පිළිබඳ සමාජය දැනුවත් කිරීම.
● සංස්කෘතික දායාදවලට හානි කිරීමෙන් වැළකීම.
● හානි කරන අය එයින් මුදවා ගැනීමට කටයුතු කිරීම.
● හානිවන අවස්ථාවල දී අදාළ ආයතන දැනුවත් කිරීම.

(iii) ● සංස්කෘතියක අඛණ්ඩ පැවැත්ම සඳහා
● අතීත උරුමයන් පිළිබඳ අභිමානය වර්ධනය වීම.
● තම සංස්කෘතියේ පවතින සුවිශේෂී බව තහවුරු වීම.
● සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා වීම.
● වෙනත් සංස්කෘතියන්ට ගරු කිරීමට යොමු වීම.
● ඒවායේ චාරිත්‍ර වාරිත්‍ර කලා ශිල්ප ආදියට ගරු කිරීම.
● සමාජ ඒකාබද්ධතාවය ඇති වීම.

06. (i) ● කහපාට දෙමළ ජන වර්ගය
● කොළපාට මුස්ලිම් ජන වර්ගය

(ii) B, C, E, G

(iii) ● වාරයක ආරම්භක දින උදෑසන රැස්වීම.
● ක්‍රීඩා උත්සව අවස්ථාවක
● ත්‍යාග ප්‍රදානෝත්සවයක දී
● කලා උළෙලක් ආරම්භයේ දී

(අදාළ නිවැරැදි පිළිතුරුවලට ලකුණු දෙන්න.)

(iii) ● ශ්‍රී ලංකාවට උරුම (ඒකදේශිය) ශාකයක් වීම.
● එහි ඇති ප්‍රයෝජනවත් බව
● ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කම
● අලංකාරවත් හා පියකරු බව
● ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව පැවැතීම.
● වෙනත් රටක ලාංඡනයක් ලෙස භාවිතා නොකිරීම.

07.

| *හරහට* | | *පහළට* | |
|---|---|---|---|
| 2. | අසුබවාදී | 1. | අයහපත් |
| 4. | පුංචි අම්මා | 3. | පුස්තකාලය |
| 6. | ලෝකෝපකාරය | 5. | කෝපය |
| 9. | විනෝදය | 7. | දයාව |
| 10. | නත්තල් | 8. | විශ්‍රාම |
| 11. | වගකීම | | |